

# ඉතිහාසයත් සෞන්දර්යයත් එක්තැන් වූ සීගිරිය පරිසර පද්ධතිය

**ආලකමන්දවක් මවා කුවෙර පුනරාවර්තයක් වීමට කාශ්‍යපයන් සිහින දුටුවේ සීගිරි පව්ව මතදීය. සීගිරි පව්ව මත එබඳු සිහිනයක එල්බ සිටි කාශ්‍යපයන් ඒ අවට හාත්පස පරිසරයෙන් ද වශීවූවාට සැකයක් නොමැත. ඒ නිසාම සීගිරි නිර්මාණයේදී පරිසර සංරක්ෂණය ගැන වඩාත් සැලකිලිමත් වීමට සීගිරි කාශ්‍යපයන් උත්සාහ කළ බවට වර්තමානයේ සීගිරිය සංස්කෘතික ත්‍රිකෝණ භූමියට පා තබන ඔබට අවබෝධකර ගැනීම එතරම් අසීරු නොවනු ඇත.**

ලෝක උරුම ස්ථානයක් වශයෙන් ලෝකයට උරුම කරදී ඇති සීගිරිය ලෝකයේ අටවන පුදු-මය වශයෙන් නම් කිරීමට ද අද සමහර වියත්හු නොපැකිලෙති. ජල උද්‍යානය, පර්වත උද්‍යානය, වසන්ත මාළිගා, බිතු සිතුවම්, කැටපත් පවුර, යන මේ සියල්ලේ ඓතිහාසික වටිනාකම් සමග 1990.01.26 දින සිට අභය භූමියක් ලෙස ප්‍රකාශ-යට පත් කර ඇති සීගිරි පරිසර පද්ධතියට ද අද විශාල වැදගත් කමක් හිමිවෙමින් පවතින බව සමහර විට ඔබ නොදන්නවා විය හැකිය. මෙම අභය භූමිය හෙක්ටයාර් 5089 ක භූමි ප්‍රමාණයක් පුරා පැතිරී පවතී.

විශේෂයෙන් සීගිරි පර්වතය පෙනි පෙනී ඒ ආසන්නයේම පිහිටි පැරණි ගමක් වන "දිය කැපිල්ල" නමැති ගම අද එම පරිසර පද්ධතියේ කේන්ද්‍රස්ථානය බවට පත්වී තිබේ. පාරිසරික හා සංස්කෘතික අධ්‍යයන මධ්‍යස්ථානය (Centre for Eco Cultural Studies) නමින් දිය කැපිල්ලේ ස්ථාපිත වී ඇති රාජ්‍ය නොවන පාරිස-රික ආයතනය විසින් සීගිරිය අවට පරිසර පද්ධ-තිය පිළිබඳව හැදෑරීමෙන් එහි පරිසර සංරක්ෂ-ණයට දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග නිසාම සීගි-රිය පරිසර පද්ධතියේ වැදගත් අංග මැනවින් හඳුනාගැනීමට අප සැමට හැකිවී තිබේ. භෞමික හා ඓතිහාසික වැදගත්කමකින් සපිරුණු සීගිරිය පරිසර පද්ධතිය සීගිරිය, පිදුරංගල හා එරව-කගල ආදී ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පර්-වත කාණ්ඩයන්ගෙන් සමන්විත වන අතර, අවට වනාන්තරය ඝර්ම කලාපීය වියළි මිශ්‍ර සදහරිත වනාන්තර ගණයට අයත්වේ. ඊසානදිග මෝසම් සුළඟින් හා අන්තර් මෝසමින් මි.මි.210 ක පමණ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලබන මෙහි සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙ.අ.25 සිට 27 දක්වා පමණ වේ.






සිගිරිය පරිසර පද්ධතිය තුළ දක්නට ලැබෙන ප්‍රමුඛ ශාක වනුයේ බුරුත, මිල්ල, හල් මිල්ල, වැනි ආර්ථික වටිනාකමකින් යුතු දැව ශාක වේ.එසේම සමස්ත ප්‍රදේශයේම කළුවර, බුරුත, වීර, පළු, කෝන් ද මිරිස්ගෝති ඔය, කිරිඔය, දඹුළු ඔය, සීගිරි ඔය මගින් පෝෂිත ප්‍රදේශය ආශ්‍රිතව නැබඩ, මී, හල්මිල්ල, තිඹිරි, මකුළු,හැලඹ, කුඹුක්, ආදී ශාක වර්ග ද සුලබව හමුවේ. මූණමල් ශාකය ඉදහිට දැකගත හැකිය.

පොදුවේ මෙම පරිසර පද්ධතියේ වන ස්ථ-රයන් සැලකිල්ලට ගැනීමේදී එය හරිත වර්-ණයෙන් දිස්වෙන අතර, වීර ශාකය වැඩි වශ-යෙන් පැතිරී පවතී. පොදුවේ ප්‍රධාන ස්ථරය කළුවර, වීර, කෝන්, දඹ, පත්, කෙකටිය, ගල්-සේරු, වෙලං වැනි ශාක වලින් ද උප ස්ථරය වැලිවරණ, අටවීරවා, ඉලිපත්හබර, හුළඹ, මයිල වැනි ශාක වලින් ද කටු පඳුරු ස්ථරය බොල්පතා, කැප්පෙටිය, කුරටිය, කොබ්බ, කුකුරුමහන්, තිඹිරි වැනි ශාක වලින් ද පොහොසත්ය. ඇත්තෙන්ම වැඩිමතක් වශ-යෙන් වන පරිසරය පුරා පැතිර ඇත්තේ අන්-දර, මසං, එරමිණියා, කරඹ, ගඳපාන, පොඩිසික්ඛාමරං, පෙකං, කොරකහ, කුරටිය, කැප්පෙටිය, බොල්පතා, දෙඩම්පතා, වැනි කටු සහිත හා කටු රහිත පඳුරු වර්ග වේ.





සීගිරි පරිසර පද්ධතිය ජෛව විවිධත්වය අතින් ද ඉතා වැදගත් තැනක් උසුලයි. සිගිරිය ආශ්‍රිත පරිසරයේ වෙසෙන ක්ෂීරපායින් සිය-යට 45 ක් පමණ දේශීය ක්ෂීරපායීන් වන බව හඳුනාගෙන තිබේ.

දැනට මෙහි ජීවත්වන බව හඳුනාගෙන ඇති ක්ෂීරපායීන් විශේෂ 40 අතර වඳුරා, උනහ-පුළුවා, ඉත්තෑවා, ඌරුමීයා, දියබල්ලා, කොළ-දිවියා, අඳුන් දිවියා, දිවියා, උරුලෑවා, මුගටියා, හිවලා, දඬුලේනා, හාවා, වවුලා,අලියා, වල්ඌරා, තිත්මුවා, ගෝනා, ඕලු-මුවා, මීමින්නා හා වලහා කිසිවෙකුට දැකබලා ගැනීම එතරම් අපහසු නොවේ. සිගිරි පරිසර පද්ධතිය පක්ෂීන් නිරීක්ෂණය කිරීම සඳහා ද ඉතා යෝග්‍ය හා පහසු පරිසරයක් සලසා දී තිබේ. මෙහි නේවාසික හා සංක්‍රමණික පක්ෂි විශේෂ 175 කට අධික ප්‍රමාණයක් නිරීක්ෂ-ණය කළ හැකි අතර, ඉන් අඩුම වශයෙන් පක්ෂි විශේෂ 75 ක් වත් කිසිවකුට එක් දිනයකදී නෙතට හසුකර ගත හැකිය.

සිගිරිය පරිසර පද්ධතිය තුළ නිරීක්ෂණය කළ හැකි පක්ෂීන් අතරට සුදු දතුඩුවා, හැඳි ආලාවා, කළුකුස්සා, සර්පකුස්සා, ලයසුදු කොරවක්කා, බෝලවටුවා, පෝරු කෑදැත්තා, උලමා, සිංගිති බස්සා, වට නිල්මල්කොහා, පොදුමල් පිළිහුඩුවා, බොටුව රතු කොට්ටෝ-රුවා, මහමිනිවිත්තා, පෙත්පෙත්ද කවුඩා, බට්ටිච්චා, හිස කළු පඳුරු දෙමලිච්චා, තුඩ ලොකු ගසරුචියා හා නිල් රදමරා ද ඇතුළත්-වන අතර, ශ්‍රී ලංකාවට ආවේනික පක්ෂි 06 ක් එනම් අළු කෑදැත්තා, වලිකුකුලා, හිසරතු කොට්ටෝරුවා, හිස කළු කොණ්ඩයා, දුඹුරු හිසැති දෙමලිච්චා ද නිරීක්ෂණය කළ හැකිය.

දේශීය මිරිදිය මාළු විශේෂ වලින් 64% ක් පමණ සිගිරිය පරිසර පද්ධතිය තුළ හමුවේ. ඒ අතර විඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති වියළි කලාපයේ මාළු විශේෂ 05 ක් ඇතුළත්වේ. සොරෙයියා, රත්කයිලයා, රැවුල් දණ්ඩියා, ඉපිලකඩයා, පෙතියා, මඩ ඉපිල්ලා, මස්පෙ-තියා, තිත් පෙතියා, තමු බණ්ඩියා, ඇහිරාවා, ඉරි අංකුට්ටා, හුංගා, කහකොරලියා, තිලාපියා, වැලිගොව්වා, පරඬල් කනයා හා මගුරා සුලබ වශයෙන් නිරීක්ෂණය කළ හැකි මත්ස්‍ය විශේෂ අතරට ඇතුළත්වේ.

සීගිරි පරිසර පද්ධතිය තුළ වාර්තාගතවී උභයජීවී විශේෂ 05 ක් පමණ වේ. ගේ ගෙම්බා, මැටි ගෙම්බා, විසිතුරු මුවපත මැඩියා, විසිතුරු රත්මැඩියා, බැලූන් මැඩියා, වෙල් මැඩියා හුණුගෝමර, ගස් මැඩියා, වැනි මැඩි විශේෂ මෙන්ම ගැරඬියා, කුර හාල-දණ්ඩා ඇහැටුල්ලා, තෙල්මල් කරවලා, දිය-නයා, දඟරනයා, අහරකුක්කා, තිත් පොළඟා, හා පළා පොළඟා වැනි උරගයන් ද මෙම පරිස-රයේ උරුමක්කාරයෝ වෙතැයි කීම නිවැරදිය. මීට අමතරව ගරා කටුස්සා, පුණුම් කටුස්සා, පුල්ලි හූණා, කරමල් බෝදිලියා, ගරාදි හික-නලා, පුල්ලි හිකනලා, ගල් ඉබ්බා, කිරි ඉබ්බා, තාරකා ඉබ්බා, තලගොයා හා කබරගොයා ද සුලබව නිරීක්ෂණය කළ හැකිය.

මෙම සිගිරිය පරිසර පද්ධතිය පිළිබඳව හැදෑරීම පිණිස මෙහි පැමිණෙන සංචාර-කයන්ට හෝ පර්යේෂකයන්ට මග පෙන්වීම සඳහා සීගිරිය හා ඒ අවට ගම්වලින් තෝරා-ගත් තරුණ පිරිසක් ද දැනටමත් පුහුණුකර සේවයෙහි යොදා ඇති අතර දිනක් දෙකක් පරිසර සුව විඳීම සඳහා නවාතැන් ගැනීමට පාරිසරික නිවහන් (Eco Lodges) කිහිප-යක් ද දියකැපිල්ල ගමේ ඉදිකර ඇති බවද මෙහිදී සඳහන් කළ යුතුමය.

■

**යූ.පී.එස්.පතිරණ**